# රබර් කර්මාන්තය නැවත නඟා සිටුවීමට ගත යුතු පියවර

එල්.එම්.කේ. තිලකරත්න සහ ඒ. නුගවෙල

ගත වර්ෂයකටත් අධික කාලයක් ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වෙමින් පැවතුණ රබර් කර්මාන්තය අද ඉතා පහත් මට්ටමක පවතින බව නොරහසකි. හෙක්ටයාර දෙලක්ෂයකට අධික බිම් ප්‍රමාණයක් වසා පැවති රබර් වගාවේ බිම් ප්‍රමාණය අද හෙක්ටයාර 124,000 කට පමණ පහත වැටී ඇත. වර්ෂ 1978 දී මෙට්‍රික් ටොන් එක් ලක්ෂ පනස් දහසක් (155,000) රබර් අප රට නිෂ්පාදනය කර තිබුණද අද එය වර්ෂයකට මෙට්‍රික් ටොන් 90,000 කට පමණ පහත වැටී ඇත.

රබර් වගාව මෙතරම් පහත් තත්ත්වයකට වැටීමට හේතුන් ලෙස නොයෙක් දෙනා විවිධ අදහස් දැක් වුවද, ඊට ප්‍රධානම හේතුව ලෝක වෙළඳ පොලේ රබර් සඳහා ගෙවනු ලබන මිළ ගණන් යන්න බව නොරහසකි. 1996 දක්වා වර්ෂ දශක දෙකක් පමණ කාලයක් රබර් මිළ කිලෝවකට රුපියල් 30 ක පමණ මට්ටමේ පැවතියද, 1994/95 වසර වල බලාපොරොත්තු නොවූ ලෙස එය කිලෝව රු.85 සිට රු.100 දක්වා ඉහළ ගියේ සෝවියට් දේශයේ කඩා වැටීම හේතු කොට ගෙන වැඩිවූ ස්වාභාවික රබර් සඳහා වූ ඉල්ලුම නිසා යැයි පැවසේ.

කෙසේ වුවද, මෙම එකවානුව තුළ ලංකාවේ රබර් නිෂ්පාදනය ද ඊට පෙර වසර කිහිපය තුළ නිපදවූ නිෂ්පාදනය අභිබවා මෙට්‍රික් ටොන් 112,600 පමණ දක්වා ඉහළ නැගුනේ කිසිදු සහනාධාරයක් හෝ රබර් සඳහා ගෙවන ලද අත් දිරි දීමනාවක් නොමැතිවය.

බොහෝ දෙනා රබර් වගාව වියලි රබර් අමු ද්‍රව්‍යය ලබා ගැනීම සඳහා පමණක් යෝග්‍ය භෝගයක් ලෙස සැලකුව ද ශ්‍රී ලංකාවේ පරිසරයට මෙම වගාවෙන් කෙරෙන මෙහෙවර සිංහරාජ වනාන්තරය වැනි වැසි වනාන්තර වලින් කෙරෙන මෙහෙවරට කිසිසේත් නොදෙවනි වෙන තරම්ය.

අද ලංකාවේ ගෙදර දොර ආහාර පිසීම සඳහාත්, පාන්, හුණු, ගඩොල් හා උළු පෝරණු සඳහාත් විශේෂයෙන්ම ලංකාවේ ප්‍රධාන අපනයන භෝගය වන තේ වියළීම සඳහාත් දර සපයනුයේ රබර් වගා වලිනි. ඒ හෙයින් රබර් වගාව විනාශ වුවහොත් ඉන් පරිසරයට අහිතකර බලපෑම් ඇතිවන අතර රටට වාර්ෂිකව අවශ්‍ය දර ලබා ගැනීම විශාල ප්‍රශ්ණයක් වනු ඇත. අද අප රටේ ඉතිරිව ඇති 20% කටත් අඩු රක්ෂිත වනාන්තර වලටද මෙය තර්ජනයක් වන බව නොඅනුමානය. එබැවින් රබර් වගාව වෙන කිසිම වගාවකින් විස්ථාපනය කරනු ලැබුවහොත් එමගින් අද ඉතිරිව ඇති 20%කටත් අඩු රක්ෂිත වනාන්තර කපා දර පිණිස ගැනීමට සිදුවන බව නොරහසකි.

1997 ඇති වූ අග්නිදිග ආසියා විනිමය පහත වැටීම හේතුවෙන් සිදුවුණු රබර් මිළ පහත වැටීම මේ වන විට ද සෑහෙන දුරට මඟහැරී ඇති බව පැහැදිලිය. එදා රු.30 ට පමණ පහත වැටුණු සාමාන්‍ය නොම්මර 3 දුම් ගැසූ ෂීට් රබර් මිළ අද කිලෝව රු.100/- පමණ දක්වා වර්ධනය වී ඇත.

රබර් වගාව කෙරෙහි සුළු වතු හිමියා මැලිවීමට රබර් මිලෙහි හොඳ වර්ධනයක් නොතිබීම සහ ආධාර මුදල් ප්‍රමාණවත් නොවීම සහ උපදේශක සේවාවන්ගේ සමහර දුර්වලතා හේතු විය හැක. එහෙත් ඊට අදාල අනෙක් ප්‍රධාන හේතුවක් නම් රබර් ශාකය සිටුවීමේ සිට මෝරා කිරි කපන අවස්ථාවට පත්වීමට ගතවන අවුරුදු 06 ක පමණ දිර්ඝ කාල පරිච්ඡේදයයි. ජිවත්වීම සඳහා ඉතා කුඩා රබර් කට්ටියක්

පමණක් ඇති සුළු වතු හිමියෙකුට තම නැවත රබර් සිටවූ ඉඩමෙන් ආදායමක් ලබන තුරු වසර හයක් පමණ කාලයක් බලා සිටීම ඉතා අසීරු කාලයයි.




එබැවින් එම කාල පරිච්ඡේදය තුළ ඔවුන්ගේ යැපීම සඳහා උපකාරවන අතුරු භෝග වගා කිරීමේ තාක්ෂණ ක්‍රම හඳුන්වාදීම රබර් ව්‍යාප්ති අංශයෙන් අනිවාර්යයෙන්ම කළ යුතු දෙයකි. මේ මඟින් නොමේරූ කාලය තුළ සුළු වතු හිමියාට ආදායමක් ලැබීම පමණක් නොව අද රටෙහි කෘෂිකර්මය සඳහා පවතින අවශ්‍ය සීමිත භූමි ප්‍රමාණයකින් උපරිම ඵල නෙලා ගැනීමට ද හැකිවනු ඇත. රබර් පර්යේෂණායතනය විසින් හඳුන්වා දෙන නිර්දේශිත ක්‍රම භාවිතයෙන් මෙම ඉලක්කයට ළඟාවීම ඉතා පහසු කාර්යයකි. මෙවැනි රබර් මිළ පහත වැටුණු අවස්ථා වල අනෙකුත් ආසියාතික රබර් නිපදවන රටවල් ද තම සුළු වතු හිමියාගේ පැවැත්ම පිණිස අනුගමනය කරනු ලබන පිළිවෙත මෙයම වේ.

නිර්දේශිත ආකාරයට අතුරු භෝග වගාවෙන්, ප්‍රධාන භෝගයන් අතුරු භෝගයටද, අතුරු භෝගය නිසා ප්‍රධාන භෝගයටද කිසිඳු තරඟකාරී තත්ත්වයක් පැන නොනඟින අතර බොහෝ විට අතුරු භෝගය නිසා ප්‍රධාන භෝගයටද ප්‍රධාන භෝගය නිසා අතුරු භෝගයටද නොයෙක් හිතකර වාතාවරණයන්ද සැලසෙනු ඇත. අද රබර් පර්යේෂණායතනය නිර්දේශ කරනු ලබන අතුරු භෝග අතර කෙසෙල්, අන්නාසි වැනි කෙටි කාලීන භෝග පමණක් නොව දිර්ඝ කාලීන තේ හා කුරුඳු වගාවන් ද වේ. තවද, මෑතක සිට අත්හදා බලනු ලබන, අතුරු භෝග ලෙස ඖෂධ ශාක සිටුවීමද ඉතා හිතකර ප්‍රතිඵල පෙන්වා ඇත. මෙවැනි ඖෂධ පැළැටි අලෙවි කිරීමද අද ඉතා පහසු කාර්යක්ව ඇත.

මෙසේ නැවත වගාවට සුළු වතු හිමියන් උනන්දු කරවීම පමණක් රබර් වගාව යළි ස්ථාපිත කිරීම පිණිස ප්‍රමාණවත් නොවේ. ලංකාවේ අද ඇති සීමිත රබර් වගා කල බිම් ප්‍රමාණයෙන් උපරිම ඵල ලබා වාර්ෂික රබර් නිෂ්පාදනය නැවතත් මෙට්‍රික් ටොන් 150,000 ක් පමණ දක්වා ඉහළ දැමීමට නම් සුළු වතු හිමියා පමණක් නොව ලංකාවේ හරි අඩක් රබර් වතු පාලනය කරනු ලබන වතු සමාගම් ද නව

තාක්ෂණය භාවිතයෙන් වතු වල ඵලදායිතාවය අද වැටී ඇති වසරකට හෙක්ටයාරයකට කිලෝ 900 ප්‍රමාණය වසරකට හෙක්ටයාරයට කිලෝ 1500 පමණ දක්වා දෙගුණ කර ගැනීම අනිවාර්යයෙන්ම කළ යුතුවේ.

සියළු රබර් නැවත වගාවන් සඳහා යොදා ගනු ලබන ඉඩම් ප්‍රථමයෙන් සියළු පැරණි මුල් කොටස් ඉවත් කොට පස් සංරක්ෂණය නිර්දේශ කරන ලද ආකාරයට කර නියමිත දුර ප්‍රමාණ වල වළවල් හාරා පැළ රෝපණය කළ යුතුය. මෙසේ කිරීමෙන් ක්ෂේත්‍රයේ සිට වූ පැළ සියල්ලම නිරෝගීව පරිනත අවස්ථාවට පත් කර ගත හැකිවේ.

නැවත වගාවේදී ඉතාම වැදගත් අවශ්‍යතාවයක් වනුයේ ගුණාත්මකභාවයෙන් උසස් පැළ යොදා ගැනීමයි. අද බොහෝ වතු වල හා තවාන් වල කරනුයේ ඉතා ප්‍රමාදවී පැලවෙන ඇට පවා බද්ධ කිරීමට යොදා ගැනීමයි. එසේ කිරීමෙන් අස්වැන්න අඩු දුර්වල ගස් ක්ෂේත්‍රයේ අවුරුදු 30 ක පමණ කාලයක් පවත්වා ගෙන යාමට වතු හිමියාට සිදුවීමයි. ගුණාත්මක බවින් උසස් ග්‍රාහක පැළද බද්ධ කිරීම පිණිස අළුතින් කප්පාදු කොට ලබාගත් නිර්දේශිත ක්ලෝන වල බද්ධ අතු යොදා බද්ධ කර ගැනීම ද අත්‍යාවශ්‍යය. එසේ නොකොට අත්හැර දමන ලද කප්පාදු නොකල වයස ගිය බද්ධ අතු ගෙන බද්ධ කිරීමෙන් ලැබෙන බද්ධ පැළ ගුණාත්මකභාවයෙන් අඩුවන අතර වයස අවුරුදු දෙකක් තුනක් වනවිට, පරිනත වූ ගස් මෙන් කණාටුවී, ජනවාරි, පෙබරවාරි මාසවල කොළ හැලීම සහ මල් පිපී එල හට ගැනීම ද සිදුවේ. මෙසේ කණාටු වී යන ගස් වලට නිරෝගී ගස් වලින් දෙනු ලබන අස්වැන්න ලබා දීමට කිසිසේත් නොහැකිවේ. එබැවින් ගුණාත්මකභාවයෙන් යුතු බද්ධ පැල නිෂ්පාදනයේදී බද්ධ පොත්ත පිළිබඳව විමසිලිමත් විමද ඉතා අවශ්‍ය වේ.

රබර් ක්ෂේත්‍රයේ ඵලදායිතාවය වැඩි කිරීමෙහිලා ඉතාම වැදගත් කරුණ වනුයේ වැඩි ඵලදායි ක්ලෝන වගා කිරීමය. දැනට රබර් පර්යේෂණායතනය මඟින් ලොකු වතු සඳහා නිර්දේශිත ක්ලෝන සය නම් RRIC 100, 102, 121, 130, PB 28/59 සහ PB 217යි. මේ ක්ලෝන සියල්ලක්ම හෙක්ටයාරයකට කිලෝ 2500 කට අධික අස්වැන්නක් දීමට හැකියාව ඇති ලෝකයේ හොඳම රබර් ක්ලෝන ලෙස පිළිගත් බව මතක් කල යුතු වේ. තවද මේ ක්ලෝන අතර ඇති PB ක්ලෝන දෙකම දින තුනකට වරක් කිරි කපන වැඩි අස්වැන්නක් ගෙන දෙන අනර්ඝ ක්ලෝන වර්ග දෙකකි.

එහෙත් කිසිදු විද්‍යාත්මක හේතු වලින් තොරව RRIC 100 සහ RRIC 121 හැර අන් ක්ලෝන වගාවට වතු සමාගම් මැළිවීම අදහා ගැනීමට අසීරු කරුණකි. මෙම ක්ලෝන 06 ට මෑතක දී ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය හඳුන්වාදුන් RRIC 130 ක්ලෝනයද ඉතා උසස් අස්වැන්නක් ලබා දෙන්නක් වන අතර එහි ද කිරි කපනුයේ දින තුනකට වරක් බැගින් වන අතර මේ ආකාරයට කිරි කපනු ලබන ක්ලෝන සිටුවීමෙන් කිරි කපන්නන්ගේ අවශ්‍යතාවය ද 33%කින් පමණ මඟ හරවා ගත හැකි වේ.

කිරි කපන්නන්ගේ හිඟය ද අද රබර් කර්මාන්තය වැටී ඇති තත්ත්වයට බොහෝ සෙයින් බලපා ඇත. මෙම තත්ත්වය උදාවීමට ඇති ප්‍රධානම හේතු අතරින් කිරි කපන්නන්ගේ වෘත්තියට අද රටේ ඇති පිළිගැනීම, ඔවුන්ට ලැබෙන ඉතා අඩු වැටුප් ප්‍රමාණය සහ ක්‍රමවත් පුහුණුවක් නොමැතිකම ප්‍රධාන තැනක් ගනී.

කිරි කපන්නන් පුහුණු කම්කරුවන් බවට පත් කිරීමට අද මැලේසියාව වැනි රටවල කෙරෙන පරිදි කාර්මික විද්‍යාල මඟින් පුහුණු පාඨමාලා පැවැත්වීම මඟින් ඔවුන්ගේ සමාජ පිළිගැනීම යම් දුරකට හෝ විසඳා ගැනීමට ඉවහල් වන අතර ඔවුන්ගේ දෛනික ආදායම වැඩි කිරීම පිණිස දිනකට ගෙන එනු

ලබන අතිරේක කිලෝ බර සඳහා වැඩිපුර දිරිදීම් ලබාදීම වතු වලටද වාසිදායක වන අතර එමගින් කිරිකපන්නන්ට ද හොඳ වේතන ලබාදීම හැකිව ඇත. කෙසේ වුවද කිරි කපන්නන්ට අර්ධ පුහුණු ශ්‍රේණි සේවකයන් සේ සලකා සිල්ලර කම්කරුවන්ට වඩා වැඩි දෛනික වැටුපක් ගෙවීම කිරි කැපීමට නවකයන් නැඹුරු කර ගත හැකි තවත් ක්‍රමයකි.

තවද කිරි කපන්නන්ගේ හිඟය බොහෝවිට ඇත්තේ පාරම්පරික රබර් වගා කරන ප්‍රදේශ වල බැවින් රබර් කර්මාන්තය පාරම්පරික නොවන මොණරාගල වැනි වියළි දිස්ත්‍රික්ක වලද ප්‍රචලිත කිරීමෙනුත් මුහුදු මට්ටමින් අඩි 1000 කට වැඩි උස් බිම් වල රබර් වගා කිරීමෙනුත් මේ ප්‍රශ්නය තවදුරටත් නිරාකරණය කර ගත හැකිවේ. ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය දැනට කර ඇති පරීක්ෂණ වල ප්‍රතිඵල වලට අනුව RRIC 100 සහ RRIC 130 වැනි ක්ලෝන මුහුදු මට්ටමින් අඩි 2500 පමණ උස්වූ ගම්පොළ වැනි ප්‍රදේශ වලද හොඳින් වගාකල හැකි බව පෙනී ගොස් ඇත. ඒ හෙයින් එම ප්‍රදේශ වල රබර් වගා කිරීමෙන් මෙම ප්‍රශ්නය තරමක් දුරට විසඳෙනු ඇතැයි අප සිතමු. මෙසේ රබර් වගා කිරීම සඳහා සැලසුම් කරනු ලබන උස් ප්‍රදේශ නම් තේ වගාවෙන් ඉවතට යන නොගැඹුරු පස් වලින් යුත් බිම් ප්‍රදේශයි. ඒවා මේවනවිට තේ දීර්ඝ කාලීනව වගාකර අත්හල ඉඩම් බැවින් ඒවායින් ඉතා විශාල ඵලදායීතාවයක් ලබා ගැනීම තරමක් අසීරුය. මෙම උස් මට්ටමේ පිහිටි අත්හැර දැමූ තේ බිම්ද රබර් වගාවට යොදාගැනීම ලංකාවේ දේශගුණය යහපත් බවට පත්කර ගැනීමටද බොහෝ උපකාරී වේ.

වර්ෂාව නිසා අපතේ යන අස්වැන්න ලබා ගැනීම පිණිස රබර් ගස් වලට වැසි ආවරණ යෙදීම ද ඉතා අවශ්‍ය වේ. මේ මගින් 45% පමණ අස්වැන්න අපතේ යාම වලක්වා ගත හැකි වන අතර එමගින් ලොකු වතු වල කරනු ලබන දෙවරු කිරි කැපීම වලකා ඒ හේතුවෙන් පොත්ත වියළීමේ රෝගය ඇතිවීම ද අවම කර ගත හැකි වේ.

අද බොහෝ රබර් වතු පාඩුවට පවත්වාගෙන යාමට හේතුව නොසැලකිලිමත්කමින් ඉහළ ගොස් ඇති නිෂ්පාදන ගාස්තු බවද පෙනී ගොස් ඇත. විශේෂයෙන්ම ක්‍රේප් කර්මාන්තයේදී උපයෝගී කර ගන්නා රසායන ද්‍රව්‍ය ප්‍රමාණ හා විදුලිය පරිභෝජනයත් කම්කරු අවශ්‍යතාත් නිර්දේශිත ප්‍රමාණයන්ට අඩු කර ගැනීම රබර් වතු වලින් ලාභ ලැබීමට සඳහා අත්‍යාවශ්‍ය වේ. රසායන ද්‍රව්‍ය අවම ලෙස භාවිතය හා විදුලි පරිභෝජනය අවම කර ගැනීම යන කරුණු දෙක තුළින්ම වතු වල පාඩු මකා දැමීමට හැකි බව අප හොඳින් පෙන්වා දී ඇත. එබැවින් රසායන ද්‍රව්‍ය නිර්දේශිත ප්‍රමාණයට අනුව යොදා ගැනීමත් විදුලි පරිභෝජනය අවම කර ගැනීමත් සියළු වතු අනුගමනය කල යුතු වන ප්‍රධාන අවශ්‍යතා අතර වේ. රසායන ද්‍රව්‍ය වල ක්‍රියාවලිය පිළිබඳව හරි අවබෝධයක් නොමැතිව ඒවා කිහිප ගුණයකින් වැඩිකර ගැනීමෙන් නිපදවන රබර් වල තත්ත්වය ද බාල කොට නිෂ්පාදන වියදම් අනපේක්ෂිත ලෙස ඉහළ දමා ගත් අවස්ථා රබර් කර්මාන්තශාලා වල නිතරම දක්නට ලැබෙන සුලභ දර්ශනයකි. එසේම ක්‍රේප් වියළුම් කුළුණු වලද උණු දිය නියමාකාර ලෙස සංසරණය නොවීමත් කුළුනේ තෙත වාතය ඉවත්ව යාම සඳහා තබා ඇති කවුළු අවහිර වීමත් නිපදවන රබර් වල තත්ත්වය බාල කරනු ලබන තවත් හේතුවේ. මේ හේතුන් නිසා රබර් වල තත්ත්වය බාල වීම පමණක් නොව වියලන දින ගණන වැඩිවීමෙන් හා වැඩිපුර දර භාවිතයෙන් නිෂ්පාදන වියදම ද අධික වනු ඇත.

සුළු වතු හිමියන් විසින් නිපදවනු ලබන ෂීට් රබර් වල තත්ත්වය පසු ගිය වසර කිහිපය තුළ ඉතා පහතට වැටී ඇත. ඊට හේතුවී ඇති ප්‍රධානම කරුණ නම් ගමේ රබර් වෙළඳුන් සුළු වතු හිමියන් ගේ නිෂ්පාදන වර්ග කිරීම නොකොට තොග මිලකට මිලයට ගැනීමයි. මේ හේතුව නිසා අද ලංකාවේ නො.01

ෂීට් නිෂ්පාදනය 15%වත් වඩා පහළ වැටී ඇති බැවින් රටේ රබර් භාණ්ඩ නිෂ්පාදන අවශ්‍යතා සඳහා අවශ්‍ය නො.01 ෂීට් පිටරටින් ගෙන්වීමට සිදුව ඇත.

මෙම ක්‍රමය මඟ හැරීමට නම් රාජ්‍ය ආයතන මඟින් ෂීට් රබර් වර්ග අනුව මිල නියම කොට මිලදී ගැනීම අත්‍යාවශ්‍ය වේ. අද ගම්මාන වල පැළපැදියම් වී ඇති තත්ත්වය වෙනස් කොට ෂීට් රබර් වර්ග වලට අනුව මිලයට ගැනීම සංවිධානය කිරීම ඉතාම අසීරු කාර්යයක් වන නමුදු එසේ නොකර දැනට පවතින ක්‍රමයට මිලදී ගැනීම රබර් මුදලාලිලා අතට පත් කොට නිහඬව සිටීමෙන් නම් රබර් කර්මාන්තයට කිසිදු සේවයක් නොවන බව පැහැදිලිය. දැනට නැවත රබර් පර්යේෂණ ආයතනය අතට පත්වී ඇති උපදේශක සේවා දෙපාර්තමේන්තුව මගින් මෙම කාර්ය බොහෝදුරට ඉටු කරවා ගැනීම අප පරමාර්ථයයි.

මේ අනුව බලන කල නව තාක්ෂණ භාවිතයෙන් රබර් වගාවේ ඵලදායිතාවය වැඩිකර රබර් වල නිෂ්පාදන වියදම අවම කර නිපදවන ලද රබර් වර්ග වලට අනුව මිළ දී ගන්නා ක්‍රමයක් ආරම්භ කරනු ලැබුවහොත් රබර් කර්මාන්තය හොඳ අනාගතයක් ඇති "හිරු නහින" කර්මාන්තයක් වනු නොඅනුමානය.